





# ටිකට්පත හොයන්න හේතුව

අයින්ස්ටයින්ට නිතරම නම් ගම් අමතක වේ. එවන් අවස්තාවක කොතෙක් මතකයට නඟා ගැනීමට උත්සාහ කළද මතක් වන්නේ නැත. දිනක් ඔහුට ඉතා දුර බැහැර ප්‍රදේශයක දේශනයකට යාමට සිදුවිය. එම ගමන තම මෝටර් රථයේ යාම ඉතා වෙහෙසකර වූ හෙයින් දුම්රියෙන් එම ගමන යාමට අයින්ස්ටයින් තීරණය කළේය. ඔහුගේ මෝටර් රථයේ රියදුරා දුම්රිය ස්ථානයට පැමිණ ටිකට් පතක් මිලදීගෙන එය අයින්ස්ටයින්ට දී "එහෙනම් සර් කෝච්චියෙන් පරිස්සමට ගිහිල්ලා මතක ඇතුව නියම ස්ටේෂන් එකෙන් බැහැගන්න" කියා අයින්ස්ටයින්ට දුම්රියෙන් බැසිය යුතු දුම්රියපළේ නම කීවේය. ටිකට් පත තම කමිස සාක්කුවට දමාගත් අයින්ස්ටයින් දුම්රියට ගොඩ වී අසුනක වාඩි විය.

අතරමගදී ටිකට්පත් පරීක්ෂකවරුන් දුම්රියට ගොඩවිය. තමාගේ ටිකට් පත කමිස සාක්කුවේ ද කලිසම් සාක්කුවේ ද බෑගයේද ඇත්දැයි අයිස්ටයින් පරීක්ෂා කළ ද ඔහුට එය සොයා ගත නොහැකි විය.
"අයින්ස්ටයින් මහත්මයා අපි ඔබව අඳුනනවා. ඔබ කිසි දිනක ටිකට් නොගෙන දුම්රියේ ගමන් නොකරන බවත් අපි දන්නවා. ටිකට් පත හොයා ගැනීමට බැරිවීම අපට ඒ තරම් ප්‍රශ්නයක් නෙමේ. ඒක නිසා ඒ ගැන කරදර වෙන්න එපා". පරීක්ෂකයෝ ඉතා කාරුණිකව අයින්ස්ටයින්ට කියා සිටියහ. අනෙකුත් දුම්රිය මැදිරි වල ටිකට්පත් පරීක්ෂාකොට ආපසු පැමිණෙන ටිකට් පරීක්ෂකවරුන් දුටුවේ අයින්ස්ටයින් ආසන යට බඩගාමින් ටිකට් පත සොයන ආකාරයයි.
"අයින්ස්ටයින් මහත්මයා ඔබතුමා කරදර වන්නට එපා. අපේ හැම ස්ටේසමකම ඉන්න අය ඔබතුමාව අඳුනනවා, ඉතින් ඔබට එතැනින් එළියට යෑමට ගැටලුවක් නෙමෙයි,ඔය ටිකට් පතේ ප්‍රශ්නය අමතක කරලා දාන්න".
එවිට අයින්ස්ටයින්
"ඒ ප්‍රශ්න අමතක කරලා දාන්න පුළුවන්, ඒත් මම බහින තැන මට අමතක වෙච්ච එකයි ප්‍රශ්නේ, මං මේ ටිකට් එක හොයන්නේ මං බහින්න ඕනේ කොතනින්ද කියලා මතක් කරගන්න" යැයි කීවේය.

